## කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2011**
**2013 මැයි - අගෝස්තු**

**මානවශාස්ත්‍ර පීඨය**

**ක්‍රිස්තියානි සංස්කෘතිය - CHCU. E1025**

**ලංකාවේ ආගම් සහ විවිධ ක්‍රිස්තියානි සභා**

**එක් කොටසකින් ප්‍රශ්න දෙකක් ඇතුලත් වන සේ ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි | කාලය : පැය 03 යි

### පළමුවන කොටස

01. කොන්ස්තන්තිනෝපල් සභාව රෝම සභාවෙන් වෙන්වීමට හේතුවූ කරුණු පැහැදිලි කරන්න.

02. මාටින් ලූතර් තුමාගේ රෙපරමාදු ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය ගැන කෙටියෙන් සඳහන් කර, එතුමාගේ ප්‍රතිසංස්කරණ ක්‍රමානුකූලව සභා නවෝදයක් ගෙන ඒමට හේතුවූ ආකාරය විස්තර කරන්න.

03. යුකරිස්තය (Eucharist) හෙවත් ස්වාමීන් වහන්සේගේ භෝජනය පිළිබඳව විවිධ ක්‍රිස්තියානි සභාවල ඉගැන්වීම් පැහැදිලි කරන්න.

04. රෝමානු කතෝලික සභාවේ පාප්තුමා සහ රදගුරුතුමන්ලා එම සභාවේ ඉටුකරන කාර්යභාරය විස්තර කරන්න.

05. සෑම ක්‍රිස්තියානි සභාවකටම එකසේ පොදු වූ ලක්ෂණ හඳුන්වා දී ඒවා විස්තර කරන්න.

### දෙවන කොටස

06. සාමකාමී සුඛිතමුදිත සමාජයක් ගොඩනැගීමට බුදුදහමේ ඉගැන්වෙන "චතුරාර්‍ය සත්‍ය" කෙතෙක් දුරට උපයෝගී කරගත හැකිදැයි විමසන්න.

07. ධම්මපදයේ සඳහන්වන ගාථා තුන (03) ක් සිංහල තේරුම් සමග ලියා, ගාථාවල ඉගැන්වීම් පිළිබඳ ඇගයීමක් කරන්න.

08. හින්දු ආගමට අනුව මිනිස් ජීවිතයේ අරමුණු හෙවත් පුරුෂාර්ථ (Objectives of Human life) පැහැදිලි කර, මෝක්ෂය හෙවත් බ්‍රහ්මසහව්‍යතාව (Companionship with God) සඳහා අනුගමනය කළ යුතු මාර්ග කවරේදැයි විස්තර කරන්න.

09. ඉස්ලාම් ආගමේ දස පාප ක්‍රියාවන් සඳහන් කර උදාහරණ දෙමින් ඒවා විස්තර කරන්න.

10. පහත සඳහන් මාතෘකා අතරින් ඔබ කැමති මාතෘකා <u>හතරකට (04)</u> ප්‍රමාණවත් කෙටි සටහන් ලියන්න.

- අ) ඉස්ලාමයේ ධර්ම කුළුණු
- ආ) හින්දු ආගමේ දේව සංකල්පය
- ඇ) භගවත් ගීතාව හෝ ශු.අල් කුරාණය
- ඈ) මොහමඩ් නබිනායක තුමා
- ඉ) බුද්ධ චරිතයේ කැපීපෙනෙන ගුණාංග
- ඊ) මෛත්‍රී භාවනාව සහ ආනාපානසති භාවනාව

****************************